# 2.2. සංඛ්‍යානමය විශ්ලේෂණ

## *2.2.1 සංඛ්‍යානමය විශ්ලේෂණය*

2020 වසර තුළදී විමර්ශනය කිරීම සහ වාර්තා කිරීම සඳහා පාර්ලිමේන්තු පෙත්සම් කාරක සභාව මගින් යොමු කරන ලද පැමිණිලි 5ට අමතරව මහජනතාවගෙන් සෘජුව පැමිණිලි 1228ක් මෙම කාර්යාලය වෙත ලැබී ඇත. 2019 වසර අවසන් වන විට නිම කිරීමට නොහැකිව ඉදිරියට ගෙන ආ පැමිණිලි 961ක වැඩකටයුතු ද අවසන් කිරීමට නියමිතව තිබුණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂය තුළ කටයුතු කිරීම සඳහා පැමිණිලි **2194**ක් පැවතිණි.


*වගුව :1 - සංඛ්‍යානමය විශ්ලේෂණය - 2020 වර්ෂය*

| | අවසන් නොවූ | අවසන් | එකතුව |
|---|---|---|---|
| 2018 වර්ෂය අවසානයේ ඉතිරිව පැවති, පැමිණිලි සංඛ්‍යාව | | | 961 |
| **(1) 2020.01.01 දින සිට 2020.12.31 දින දක්වා ලැබුණු මුළු පැමිණිලි සංඛ්‍යාව :-** | | | |
| (I) සෘජුව ලැබුණු පැමිණිලි | 1228 | | |
| (II) මහජන පෙත්සම් කාරක සභාව මගින් යොමු කරන ලද පැමිණිලි | 5 | | |
| **(2)** 2020 වර්ෂයේ ලැබුණු මුළු පැමිණිලි සංඛ්‍යාව | | | 1233 |
| **2020 වර්ෂය තුළ කටයුතු සිදු කිරීමට නියමිත මුළු පැමිණිලි වල එකතුව :-** | | | **2194** |
| **2020 වර්ෂය තුළ විමර්ශනය කරන ලද සමස්ත පැමිණිලි සංඛ්‍යාව :-** | | | |
| **(1) ප්‍රාථමික අවධියේදී අවසන් වූ පැමිණිලි :-** | | | |
| i. ඔම්බුඩ්ස්මන්වරයාගේ බලතල යටතට නොවැටෙන පැමිණිලි | | 521 | |
| ii. පැහැදිලි සහනයක් සඳහා ඉල්ලීම් නොකිරීම හේතුවෙන් අවධානය යොමු නොකරන ලද පැමිණිලි | | 25 | (546) |
| **(2) අදාල ආයතන වෙතින් වාර්තා කැඳවීමෙන් පසු පරීක්ෂණයට භාජනය කරන ලද පැමිණිලි :-** | | | |
| i. පැමිණිල්ලේ කරුණු අනුව බැලූ බැල්මට ඒ සම්බන්ධයෙන් පරීක්ෂා කර බැලීම අවශ්‍යවීම හේතුවෙන් අදාල ආයතන වෙතින් වාර්තා කැඳවන ලද පැමිණිලි - අවසන් නැත | 462 | | |
| ii. වාර්තා කැඳවීමෙන් පසු එහි සඳහන් කරුණු අනුව, තවදුරටත් එම ආයතනය මගින් හෝ වෙනත් පාර්ශව වෙතින් වාර්තා කැඳවන ලද පැමිණිලි - අවසන් නැත | 340 | | |
| iii. එකී වාර්තා කැඳවීමෙන් පසු ඉල්ලීම සාර්ථකව ඉටු වී ඇති පැමිණිලි | | 188 | |
| iv. වාර්තා කැඳවීමෙන් පසු නිර්දේශ නිකුත් කර සහන ලැබී ඇති පැමිණිලි | | | |
| v. වාර්තා කැඳවීමෙන් පසු ඉල්ලීම ප්‍රතික්ෂේප වූ පැමිණිලි | | 437 | |
| vi. පැමිණිලිකරුවන් උනන්දුවක් නොදැක්වීම හේතුවෙන් කටයුතු අවසන් කරන ලද ගොනු | | 178 | (803) |
| **(3) වාර්තා කැඳවීමෙන් පමණක් තීරණයකට එළඹීමට අපහසු වීම හේතුවෙන්, දෙපාර්ශවය කැඳවා පරීක්ෂණ වලට භාජනය කරන ලද පැමිණිලි :-** | | | |
| i. වාර්තා කැඳවීමෙන් පසු පැමිණිලිකරුවන් හා වගඋත්තරකරුවන් කැඳවා තවදුරටත් පරීක්ෂණ පවත්වන ලද පැමිණිලි - අවසන් නැත | 23 | | |
| ii. පරීක්ෂණ වලින් පසු ඉල්ලීම ප්‍රතික්ෂේප වන පැමිණිලි | | 11 | |
| iii. පරීක්ෂණ වලින් පසු ඊට අදාලව නිර්දේශ නිකුත් කරන ලද පැමිණිලි - අවසන් නැත | 3 | | |
| iv. නිර්දේශ ක්‍රියාත්මක වීමෙන් පසු පැමිණිලිකරුවන් වෙත සහන සැලසී ඇති පැමිණිලි | | 4 | |
| v. දෙන ලද නිර්දේශ නොසලකා හැර ඇති පැමිණිලි | | 2 | (17) |
| **(1)+(2)+(3) මුළු එකතුව** | | | (1366) |
| **2020.12.31 දින වන විට ඉතිරි පැමිණිලි සංඛ්‍යාව** | | | **828** |

### 2.2.2 පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියා කළ ආකාරය

**2020 වර්ෂයේදී කටයුතු කිරීමට නියමිතව තිබූ මුළු පැමිණිලි සංඛ්‍යාව 2194ක් වූ අතර, ඉදිරි වර්ෂයට ගෙන යන ලද පැමිණිලි සංඛ්‍යාව 828 කි. ඒ අනුව, පැමිණිලි 1366 කටයුතු 2020 වර්ෂයේදී අවසන් කර ඇත.** (වගුව:1 - සංඛ්‍යානමය විශ්ලේෂණය - 2020 වර්ෂය මගින් දැක්වූ පරිදි) එම පැමිණිලි සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග පිළිබඳ සාරාංශය පහත මගින් දන්වා ඇත.

*ප්‍රස්තාරය 1: 2020 වර්ෂයේදී පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියා කළ ආකාරය*





| පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියා කළ ආකාරය | පැමිණිලි සංඛ්‍යාව |
|---|---|
| මැදිහත්විය නොහැකි පැමිණිලි | 546 |
| වාර්තා කැඳවීමෙන් පසු ඉල්ලීම ඉටු වූ පැමිණිලි | 188 |
| පරීක්ෂණ පැවැත්වීමෙන් පසු ඉල්ලීම ඉටු වූ පැමිණිලි | 4 |
| වාර්තා කැඳවීමෙන් හා පරීක්ෂණ පැවැත්වීමෙන් පසු ඉල්ලීම ප්‍රතික්ෂේප වූ පැමිණිලි | 626 |
| දෙන ලද නිර්දේශ නොසලකා හැර ඇති පැමිණිලි | 2 |
| ඉදිරි වර්ෂයට කටයුතු කිරීමට ඉතිරි වන පැමිණිලි | 828 |
| **2020 වර්ෂය තුල කටයුතු සිදු කිරීමට නියමිතව තිබූ මුළු පැමිණිලි වල එකතුව** | **2194** |

### *2.2.3 <u>මාසික විශ්ලේෂණය</u>*

2020 වසර තුලදී ලැබුණු මුළු පැමිණිලි 1233ක් විය. රටතුල පැවති කොවිඩ් 19 වෛරස් ව්‍යාප්තිය හේතුවෙන් අප්‍රේල් මාසයේ කාර්යාලය වසා තැබීම මත පැමිණිලි නොලැබූ අතර, වැඩිම පැමිණිලි සංඛ්‍යාව වන 174, ජනවාරි මාසය තුලදී ඉදිරිපත් විය. අදාල විස්තර 1 වන ප්‍රස්තාරයේ පැහැදිලි කර ඇත.

*ප්‍රස්තාරය: **2 - 2020** වර්ෂයේදී එක් එක් මස තුල ලද පැමිණිලි සංඛ්‍යාව*




## 2.2.4 ස්ත්‍රී/පුරුෂ වශයෙන් ලද පැමිණිලි පිළිබඳ විශ්ලේෂණය

වර්ෂය තුල ගොනු කරන ලද පැමිණිලි 853ක් පුරුෂ පාර්ශවය විසින් ද, 380ක් ස්ත්‍රී පාර්ශවය විසින් ද ඉදිරිපත් කර ඇත. 2 වන වගුවේ සහ 3 වන ප්‍රස්තාරයේ ඒවා විස්තර කර ඇත.

*වගුව: 2 - 2020 වර්ෂයේ දී ස්ත්‍රී පුරුෂ වශයෙන් ලද මුළු පැමිණිලි සංඛ්‍යාව*

| මාසය | පුරුෂ | ස්ත්‍රී | එකතුව |
|---|---|---|---|
| ජනවාරි | 122 | 52 | 174 |
| පෙබරවාරි | 91 | 46 | 137 |
| මාර්තු | 56 | 31 | 87 |
| අප්‍රේල් | 0 | 0 | 0 |
| මැයි | 10 | 8 | 18 |
| ජූනි | 96 | 50 | 146 |
| ජූලි | 88 | 32 | 120 |
| අගෝස්තු | 67 | 33 | 100 |
| සැප්තැම්බර් | 107 | 30 | 137 |
| ඔක්තෝබර් | 82 | 41 | 123 |
| නොවැම්බර් | 66 | 25 | 91 |
| දෙසැම්බර් | 68 | 32 | 100 |
| **එකතුව** | **853** | **380** | **1233** |


*ප්‍රස්තාරය: 3 - 2020 වර්ෂයේ දී ස්ත්‍රී පුරුෂ වශයෙන් ලද මුළු පැමිණිලි සංඛ්‍යාව*



### *2.2.5 දිස්ත්‍රික්ක විශ්ලේෂණය*

2020 වර්ෂය තුල වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් ලැබී ඇත්තේ කොළඹ දිස්ත්‍රික්කයෙන් වන අතර, එය 149කි. අනතුරුව, වැඩිම පැමිණිලි සංඛ්‍යාව ලෙස ගාල්ල දිස්ත්‍රික්කයෙන් පැමිණිලි 136ක් ද, මහනුවර දිස්ත්‍රික්කයෙන් පැමිණිලි 100ක් ද ලැබුණි. කිලිනොච්චිය දිස්ත්‍රික්කයෙන් කිසිදු පැමිණිල්ලක් ලැබී නැත. පහත දැක්වෙන 4 ප්‍රස්තාරය බලන්න.

**ප්‍රස්තාරය: 4 -** <u>පැමිණිලිකරුවන්ගේ නිත්‍ය පදිංචි දිස්ත්‍රික්කය අනුව කරන ලද වර්ගීකරණයට අනුව 2020 වර්ෂයේදී ලද මුළු පැමිණිලි සංඛ්‍යාව</u>



## 2.2.6 විෂය විශ්ලේෂණය

2020 වර්ෂය තුල දී ඉඩම් බලපත්‍ර, රජයේ ඉඩම් ප්‍රදාන, විශ්‍රාම වැටුප් සම්බන්ධ ගැටලු, වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ගැටළු කාර්යාලවල සේවකයන්ගේ ස්ථිර කිරීම්, සේවය අවසන් කිරීම්, නැවත සේවයේ පිහිටුවීම්, උසස්වීම්, වැටුප් විෂමතා, වැටුප් වර්ධක, හිඟ මුදල් ඉල්ලා සිටීම්, අදාල නිලධාරීන් ක්‍රියාත්මක නොවීම, සේවක අර්ථසාධක අරමුදල් ගෙවීම, අනවසර ඉදිකිරීම් සහ හිරිහැර කිරීම්, බලපත්‍ර නිකුත්කිරීම්, ගොඩනැගිලි අවසර පත්‍ර සම්බන්ධ ගැටළු යන කරුණු සම්බන්ධයෙන් සැලකිය යුතු පැමිණිලි ප්‍රමාණයක් ලැබී තිබුණි. පහත 3 වන වගුව බලන්න.

වගුව 3 : - 2020 වර්ෂය තුළ විෂයානුගතව මහජන නිලධාරීන්ට විරුද්ධව ලැබූ පැමිණිලි මුළු සංඛ්‍යාව

| | විෂය | පැමිණිලි සංඛ්‍යාව 2020 |
|---|---|---|
| 1 | ඉඩම් බලපත්‍ර, රජයේ ඉඩම් ප්‍රදානය | 133 |
| 2 | විශ්‍රාම වැටුප්, වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප | 110 |
| 3 | සේවය අවසන් කිරීම්, නැවත සේවයේ පිහිටුවීම්, දීර්ඝ කිරීම්, කාර්යක්ෂමතා කඩඉම් | 82 |
| 4 | සේවා අන්තර්ග්‍රහණය කිරීම්, බඳවා ගැනීම්, පත්වීම්, ස්ථිර කිරීම්, පෙරදාතම් කිරීම් | 81 |
| 5 | වැටුප් විෂමතා, වැටුප් වර්ධක, හිඟ මුදල්, දීමනා | 77 |
| 6 | ප්‍රමාදය, නොහැකියාව, නොසලකා හැරීම, බලය අනිසි ලෙස භාවිත කිරීම | 69 |
| 7 | උසස්වීම්, ජ්‍යෙෂ්ඨත්වය | 63 |
| 8 | විශ්ව විද්‍යාල/පාසැල් වලට ඇතුලත් වීම, විභාග ප්‍රතිඵල | 52 |
| 9 | අනවසර ඉදිකිරීම්/පීඩාවන් | 47 |
| 10 | විවිධ | 25 |
| 11 | මාර්ග පද්ධති | 24 |
| 12 | වන්දි ගෙවීම, දුප්පතුන්ට සහනාධාර, සමෘද්ධි | 19 |
| 13 | සේවා ස්ථානයෙන් මාරු කිරීම | 15 |
| 14 | සේවක අර්ථසාධක අරමුදල, සේවක භාරකාර අරමුදල, පාරිතෝෂික දීමනා | 15 |
| 15 | බලපත්‍ර, ගොඩනැගිලි අවසර පත්‍ර | 12 |
| 16 | සේවා ස්ථානයේ දී වන හිරිහැර | 12 |
| 17 | විදුලිය, ජලය, දුරකතන සම්බන්ධ කිරීම් හා විසංධි කිරීම් | 9 |
| 18 | ණය, අයකිරීම්, නැවත උපලේඛනගත කිරීම | 6 |
| 19 | මැදිහත්විය නොහැකි | 382 |
| | **මුළු පැමිණිලි ගණන** | **1233** |

## 2.2.7 අමාත්‍යාංශ/ මහජන ආයතන විශ්ලේෂණය

පහත වගුව නිරීක්ෂණය කිරීමේදී පෙනීයන්නේ, ස්වදේශ කටයුතු ; දිස්ත්‍රික් ලේකම් කාර්යාල/ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යන අමාත්‍යාංශවල නිලධාරීන්ට එරෙහිව පැමිණිලි විශාල සංඛ්‍යාවක් ලැබී ඇති බවයි. විමර්ශන වලදී පැහැදිලි වී ඇත්තේ පැමිණිලි වැඩි ප්‍රමාණයක් ලැබී ඇත්තේ ප්‍රාදේශීය ලේකම්වරුන්ට එරෙහිව වන අතර ඒවායෙන් බොහොමයක් රජයේ ඉඩම් බලපත්‍ර නිකුත් කිරීම සහ ප්‍රදානයන් ලබා දීම් යනාදී කරුණු වලට අදාලව වේ. පහත 4 වගුව බලන්න.

වගුව 4 :- අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, අධිකාරි සහ රජයේ ආයතන වල නිලධාරීන්ට විරුද්ධව ලැබූ පැමිණිලි සංඛ්‍යාව

| | අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, අධිකාරී ආදී ... | පැමිණිලි සංඛ්‍යාව |
|---|---|---|
| 1 | ස්වදේශ කටයුතු ; දිස්ත්‍රික් ලේකම් කාර්යාල/ප්‍රාදේශීය ලේකම් කාර්යාල | 160 |
| 2 | අධ්‍යාපන හා උසස් අධ්‍යාපන | 147 |
| 3 | පළාත් සභා හා පළාත් පාලන ආයතන | 91 |
| 4 | විශ්‍රාම වැටුප් | 71 |
| 5 | සංස්ථා, අධිකාරී,මණ්ඩල (CPC, CEB, SLAA, RDA,SLBC,SLRC) | 57 |
| 6 | සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය | 39 |
| 7 | විවිධ ආයතන | 30 |
| 8 | වාරිමාර්ග සහ මහවැලි අධිකාරිය | 27 |
| 9 | ගමනාගමන (SLCTB, CGR, CMV) | 25 |
| 10 | ආරක්ෂක සහ අභ්‍යන්තර ආරක්ෂක | 23 |
| 11 | කෘෂිකර්ම | 21 |
| 12 | රාජ්‍ය සේවා කොමිසම (මධ්‍යම සහ පළාත්) | 20 |
| 13 | රාජ්‍ය පරිපාලන | 20 |
| 14 | සමුපකාර සංවර්ධනය | 16 |
| 15 | සමාජ සේවා හා සමෘද්ධි | 12 |
| 16 | විශ්ව විද්‍යාල | 11 |
| 17 | තැපැල් සහ විදුලි සංදේශ | 9 |
| 18 | ඉඩම් සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම | 9 |
| 19 | රජයේ බැංකු | 8 |
| 20 | මුදල් | 7 |
| 21 | විදේශ සේවා නියුක්ති කාර්යංශය | 7 |
| 22 | වන සංරක්ෂණ | 7 |
| 23 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 5 |
| 24 | නාගරික සංවර්ධන අධිකාරිය | 4 |
| 25 | ජාතික තරුණ සේවා සභාව | 4 |
| 26 | අධිකරණ | 3 |

| | | |
|---|---|---|
| **27** | භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය | 3 |
| **28** | සුරාබදු දෙපාර්තමේන්තුව | 3 |
| **29** | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | 2 |
| **30** | පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව | 2 |
| **31** | විභාග දෙපාර්තමේන්තුව | 2 |
| **32** | වැව්ලි | 2 |
| **33** | කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව | 2 |
| **34** | මධ්‍යම සංස්කෘතික අරමුදල | 2 |
| | **මුළු පැමිණිලි ගණන** | **851** |

## *2.2.8 <u>වසර 10 තුල පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) කාර්යාලය වෙත ලද පැමිණිලි පිළිබඳ විශ්ලේෂණය</u>*

2020 වර්ෂයද ඇතුලත්ව වසර 10ක් තුල ලැබුණු පැමිණිලි සම්බන්ධයෙන් නිරීක්ෂණය කිරිමේදී පෙනී යන්නේ, වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් ලැබී ඇත්තේ 2019 වර්ෂය තුල බවයි. එය 1794කි. අනතුරුව වැඩිම පැමිණිලි සංඛ්‍යාව ලෙස 2012 වර්ෂයේදි පැමිණිලි 1769ක් ද, 2018 වර්ෂයේදී පැමිණිලි 1588ක් ද ලැබී ඇත. අඩුම පැමිණිලි සංඛ්‍යාවක් ලැබී ඇත්තේ 2014 වර්ෂයේදී ය. රට තුල පැවති වසංගත තත්ත්වය හේතුවෙන් මෙම වර්ෂය ලද පැමිණිලි සාපේක්ෂව අඩු වී ඇත. (ප්‍රස්තාරය 5)

**ප්‍රස්තාරය: 5 - වසර 10ක් තුල ලද පැමිණිලි සංඛ්‍යාව**

